කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022
2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

**සමාජීය විද්‍යා පීඨය**

**භූගෝල විද්‍යාව**
**(අධ්‍යයන වර්ෂ 2009 සිට 2016 දක්වා)**

**මානුෂ භූගෝල විද්‍යාවට හැඳින්වීමක් GEOG - E1025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. මානුෂ භූගෝලවිද්‍යා විෂය ක්ෂේත්‍රය හඳුන්වා එහි ප්‍රායෝගික වැදගත්කම උදාහරණ මගින් ගෙනහැර දක්වන්න. (ලකුණු 20)

02. i. ''මානව සංස්කෘතිය'' යන සංකල්පය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05)

    ii. මානව සංස්කෘතියේ ප්‍රාදේශීය විවිධත්වය උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 15)

03. මානව ආර්ථික කටයුතුවල විවිධත්වය කෙරෙහි බලපාන භූගෝලීය සාධක 04ක් උදාහරණ මගින් විග්‍රහ කරන්න. (ලකුණු 20)

04. i. 'සම්පත්'' සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 05)

    ii. බලශක්ති උත්පාදනයේ දී 'සුනිත්‍ය බලශක්ති' (Renewable energy) මූලාශ්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමුකළ යුතු වන්නේ කුමක් නිසාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 15)

05. සංවර්ධනය වන රටවල දක්නට ලැබෙන ජන සංඛ්‍යා ප්‍රවණතා 04 ක් නිශ්චිත උදාහරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

06. සංවර්ධනය වන රටවල ''සීඝ්‍ර නාගරීකරණය'' ආශ්‍රිතව දක්නට ලැබෙන අභියෝග 04ක් පෙන්වා දෙන්න. (ලකුණු 20)

07. රටවල් අතර සංවර්ධන විෂමතා බිහිකිරීමට බලපාන ප්‍රධාන සාධක 04ක් උදාහරණ ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 20)

08. පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් (02) කෙටියෙන් විස්තර කරන්න.

    i. මානව පරිණාමය
    ii. තිරසාර සංවර්ධනය
    iii. ගෝලීයකරණය
    iv. පරිසර සංරක්ෂණය (ලකුණු 10x2=20)

*****************************